# නම්පොත හෙවත් විහාර අස්න පිළිබඳ විමර්ශනයක්

හසිත චාමිකර ගුණසිංහ[1], හෙම්මාතගම පියදස්සි හිමි[2]

## හැඳින්වීම

මහනුවර යුගයේ දී වැලිවිට සරණංකර සඟරජ මාහිමියන් විසින් ඇති කරන ලද ශාස්ත්‍ර ප්‍රබෝධය යටතේ භාෂා අධ්‍යයනය වෙනුවෙන් සකසන ලදැයි සැලකෙන නිර්දිෂ්ට ග්‍රන්ථමාලාවක් ප්‍රකට ය. ඒවා පිළිවෙළින් හෝඩිය, නම්පොත, මඟුල් ලකුණ, ගණදෙවි හැල්ල, වදන්කවිපොත, බුද්ධගජ්ජය සහ සකස්කඩ යනාදිය වේ. මෙහි දී පළමුව සිංහල හෝඩිය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා නවක ශිෂ්‍යයා දෙවනුව ලිහිල් අක්ෂර සංයෝග සහිත වචන උච්චාරණය හුරු කරගැනීම සඳහා නම්පොත පරිශීලනය කළ යුතු වේ. ලක්දිව පුරා පිහිටා තිබෙන විහාර දේවාලවල 267ක නාමාවලියක් ඊට අන්තර්ගත වී ඇති හෙයින් 'නම්පොත' සහ 'නම්ගම්පොත' යනුවෙන් හඳුන්වන්නට ඇතැයි පිළිගත හැකි ය. 'අස්න' යනු පණිවුඩයයි. එම කෘතියේ අවසානයට විහාර හා දේවාලවලට අධිගෘහිත වූ දෙවිවරුන්ට සංඝාඥාවක් නිකුත් කරන බැවින් 'විහාර අස්න' යනුවෙන් ඊටම ව්‍යවහාර වී ඇති බව පෙනේ. යුගයෙන් යුගයට ඉදි කරන ලද විහාර සහ දේවාල නාම සංග්‍රහ වෙමින්, මහනුවර යුගයේ දී අවසන් වරට නව සංශෝධන සහිතව සම්පාදනය කොට පරිසමාප්තියට පත්ව තිබෙන මෙම කෘතියේ කතුවරයා අත්තරගම රාජගුරු බණ්ඩාර නමැති පඬිවරයා යැයි සැලකේ. පිරිවෙන් අධ්‍යාපනයේ වැදගත් කොට සලකන පාඨ්‍ය ග්‍රන්ථ රැසක් සම්පාදනය කිරීම සඳහා හෙතෙම පුරෝගාමී වූ බවට තොරතුරු හමු වේ. සාම්ප්‍රදායික අධ්‍යාපනයේ දී නම්පොතට හිමි වූ ස්ථානය පිළිබඳ අධ්‍යයනය කිරීම අරමුණු කරගත් මෙම පර්යේෂණයේ ගැටලුව බවට පත්වූයේ නම්පොත වාචෝද්ග්‍රහණය කිරීමේ අවශ්‍යතාව කුමක් ද යන්න සොයා බැලීමයි. ඊට අන්තර්ගත කර තිබෙන විහාර සහ දේවාලවල කිසියම් අනුක්‍රමික ස්වභාවයක් ඔස්සේ පෙළගස්වා ඇත්දැයි යන්න පිළිබඳ මෙහි දී විශේෂ අවධානය යොමුවිය. 1950 දශකයේ දී පන්නිල සාරානන්ද නාහිමියන් සහ ඕපාත සරණංකර නාහිමියන් විසින් සම්පාදිත විවරණ සහිත නම්පොත හෙවත් විහාර අස්න කෘතිය හැරෙන්නට නම්පොත පිළිබඳ මෙතෙක් පුළුල් අධ්‍යයනයක් සිදුව නොතිබීම ද ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට බලපෑ ප්‍රධාන හේතුවකි. නම්පොතට අන්තර්ගත වී තිබෙන ඇතැම් විහාර සහ දේවාල මේ වන විට අභාවයට පත්ව තිබීම, එක ම නමින් හැඳින්වෙන සිද්ධස්ථාන කිහිපයක් පැවතීම සහ වර්තමානයේ දී වෙනත් නම් භාවිත කිරීම නිසා සිද්ධස්ථානය නිශ්චිතව හඳුනාගැනීම දුෂ්කර වීම යනාදී ගැටලු නිසා මෙම පර්යේෂණයේ සීමා ඇතිව තිබේ.

1. ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. hasithac@kln.ac.lk
2. පරිවේණාචාර්ය, කුඹුරුලෙන ශ්‍රී සිද්ධාර්ථ පිරිවෙන, රිදීගම.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ ක්‍රමවේදය බවට පත්වූයේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. එහි දී නම්පොතේ මූලික පෙළට අමතර ව පන්නිල සාරානන්ද නාහිමියන් සහ ඕපාත සරණංකර නාහිමියන් විසින් සම්පාදිත විවරණ සහිත නම්පොත හෙවත් විහාර අස්න කෘතිය ප්‍රධාන වශයෙන් පරිශීලනය කෙරිණි. ඊට අමතර ව නම්පොත පිළිබඳ විද්වත් අදහස් ඇතුළත් ද්විතියික මූලාශ්‍රය අධ්‍යයනය කරන ලදි. සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ නම්පොතට අන්තර්ගත වී තිබෙන විහාරස්ථානවල වැඩසිටින භික්ෂූන්ගෙන් හා දේවාලවල භාරකරුවන්ගෙන් තොරතුරු එක්රැස් කරගන්නා ලදි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ලක්දිව පුරාණ සාම්ප්‍රදායික අධ්‍යාපනය තුළ මූලික අවස්ථාවේ දී නම්පොත වාචෝද්ග්‍රහණය කළ යුතු විය. එය වර්තමානයේ පාරිවෙණික අධ්‍යාපනයේ ද භාවිත වන්නකි. රට පුරා විසිරී පවත්නා විහාර සහ දේවාල පිළිබඳ කුඩා කාලයේදීම නාමික වශයෙන් හෝ කිසියම් අදහසක් ඇතිකරවීම එහි මූලික අරමුණක් වන්නට ඇතැයි පිළිගත හැකි ය. එම ස්ථාන වන්දනාමාන කිරීමට කිසියම් පෙළඹවීමක් ඇතිකරවීම ද මෙමගින් සිදුව තිබේ.

එසේ ම නම්පොත මගින් අක්ෂර උච්චාරණය සඳහා ශිෂ්‍යයන් පුහුණු කරවීම ද සිදුව තිබේ. සිංහල හෝඩිය උගත් නවක ශිෂ්‍යයා නම්පොත සජ්ඣායනය කරන විට සිංහල හෝඩියේදී උගත් ස්වර, ව්‍යාංජනාක්ෂර පදයක යොදා උච්චාරණය කරවීම මැනවින් ප්‍රගුණ කරයි. අකාරාදී පිළිවෙළක් නොමැති නමුත් උච්චාරණයට පහසුවන ආකාරයේ කිසියම් රිද්මයකට නම්පොත සම්පාදනය කොට ඇති අතර සජ්ඣායනය කරන අතරතුර නැවැත්විය යුතු ස්ථාන ඇතැම් පැරණි අත්පිටපත්වල කුණ්ඩලී පිහිටුවා දක්වා ඇති බව පෙනේ. උදාහරණයක් ලෙස සගම පස්ගම අරත්තන මාදන්වල විල්වල කඩදොර මොරපාය දිඹුල පුසුල්පිටිය නියම්ගම්පායස්ථානය මෙහි දී උක්ත පදවැල ඇදෙන්නේ නියම්ගම්පායස්ථානය නමිනි. ඉන්පසුව පදවැල ඇරඹෙන්නේ වල්වාසගොඩෙනි.

පිරිත් දේශනා සම්ප්‍රදායයේ එන සති පිරිත් දේශනාවේ දී 'විහාර අස්න කීම' වැදගත් අවස්ථාවකි. තත් දේශනාව අවසානයේ දේවාල තල්පත ලියා දේවදූතයකු අත එය පිටත් කරවා ලක්දිව විහාර දේවාලවලට අධිගෘහිත සියලු දෙවියන් කැඳවාගෙන එන මෙන් ඇරයුමක් කරනු ලැබේ. ඊට පූර්වයෙන් 'සගම පස්ගම අරත්තන මාදන්වල....' යනාදී වශයෙන් විහාර අස්න හෙවත් නම්පොත, ඊට ආවේණික ස්වරයෙන් සජ්ඣායනය කොට අවසානයේ සංඝාඥාවක් සිදු කරනු ලැබේ. ඒ අනුව මෙකී චාරිත්‍ර ධර්ම ඉටුකිරීමට ද හැකිවන අන්දමට කුඩා කාලයේ දී ම නම්පොත වාචෝද්ග්‍රහණය කර ගැනීම නිර්දිෂ්ඨ කළා විය හැකි ය.

දේශක ශෛලියට යෝග්‍ය වන පරිදි රිද්මයානුකූලව නැවැත්විය හැකි තැනකින් එක් කාණ්ඩයක් නිමවනවා මෙන් ම මෙහි එක් විහාර නම්වැලක් කිසියම් ප්‍රදේශයක් නියෝජනය කරයි. ඒ අනුව ප්‍රාදේශීය පදනම හෝ එකම ගමන් මාර්ගයක පිහිටීම යන පදනම මත එක් එක් කාණ්ඩය පෙළගස්වා තිබෙන අතර එහි දී පහසුවෙන් උච්චාරණය

කළ හැකි වන අන්දමට විහාර දේවාල නාම පෙළගස්වා ඇති බව ද හඳුනාගත හැකි ය.

සගම රජමහ විහාරයේ සිට විහාර අස්න හෙවත් නම්පොත පෙළගැස්වෙන හෙයින් එහි කතුවරයා එම ප්‍රදේශයේ උපන් අයකු බවට අදහසක් සගම ප්‍රදේශයේ පවතී. සගම ප්‍රදේශවාසියකු ලක්දිව සිද්ධස්ථාන වන්දනා කිරීමේ අරමුණින් සගම විහාරයේ සිට පිළිවෙළින් පස්ගම, අරත්තන, මාදන්වල ආදී අවට සිද්ධස්ථාන වන්දනා කරමින් වන්දනා ගමන ආරම්භ කරනු ලැබ තිබේ. ඔහු වන්දනා ගමනේ යෙදී ඇත්තේ එවකට මාර්ග පහසුකම් ආදිය පැවති මාර්ගයක බවත්, අතරමග හමු වූ අම්බලම් ආදියේ රාත්‍රිය ගත කරමින් වන්දනාවේ යෙදුණු මගියා ඔහුගේ වන්දනා ගමන මහනුවර ශ්‍රී දළදා මාලිගාව වන්දනා කිරීමෙන් නිමාවට පත් කරන ලදැයි කියැවේ. සිද්ධස්ථාන පිහිටීමේ පිළිවෙළ සහ වර්තමානයේදී පවා මෙම මාර්ගයේ පවතින අම්බලම් එකී අදහස සනාථ කරයි.

ලංකාවේ සෑම පළාතක්ම ආවරණය කෙරෙන අන්දමට විහාර සහ දේවාල නම්පොතට අන්තර්ගත වී තිබීම ද විශේෂත්වයකි. වර්තමාන පළාත් බෙදීම අනුව නම්පොතට අන්තර්ගත සිද්ධස්ථාන පහත පරිදි එක් එක් පළාත්වල පිහිටා තිබේ;

| | |
|---|---|
| නැගෙනහිර පළාතේ සිද්ධස්ථාන | 05 |
| ඌව පළාතේ සිද්ධස්ථාන | 07 |
| උතුරු පළාතේ සිද්ධස්ථාන | 12 |
| දකුණු පළාතේ සිද්ධස්ථාන | 14 |
| උතුරුමැද පළාතේ සිද්ධස්ථාන | 30 |
| බස්නාහිර පළාතේ සිද්ධස්ථාන | 35 |
| වයඹ පළාතේ සිද්ධස්ථාන | 43 |
| සබරගමුව පළාතේ සිද්ධස්ථාන | 46 |
| මධ්‍යම පළාතේ සිද්ධස්ථාන | 75 |

**නිගමනය**

නම්පොත, ලක්දිව සම්භාව්‍ය අධ්‍යාපනය යටතේ බාල වියේ දී ම වාචෝද්ග්‍රහණය කරවන ලද බෞද්ධ විහාර සහ දේවාල 267කින් සමන්විත නාමාවලියකි. මෙම නාමාවලිය යුගයෙන් යුගය සම්පාදනය වෙමින් මහනුවර යුගයේ දී පරිසමාප්තියට පත් වූ බව පිළිගත හැකි ය. මෙමගින් ඉදිරිපත් වන්නේ ලක්දිව පුරාණ සිතියමයි. මෙරට ආර්ථිකය, ගමනාගමනය, ජනාවාසකරණය විහිද ගොස් ඇත්තේ ඊට අන්තර්ගත විහාර දේවාල නාමාවලිය මුල්කොටගෙන බව පෙනේ. එකී විහාර දේවාලවල ශේෂව පවත්නා උරුමය, ජාති ආගම් භේදයකින් තොරව මුළුමහත් ලාංකේය ජාතියටම අභිමානයට පත්විය හැකි ජාතික උරුමයකි. යථොක්ත සිද්ධස්ථාන ඔස්සේ විචාරශීලීව ගමන් කරන්නකුට මෙරට වැසියන්ගේ සංචරණ ගමන් මාර්ගය, ජනාවාසකරණය, දේශපාලන බල ව්‍යාප්තිය, ආර්ථික තත්ත්වය, ප්‍රාදේශීය සංවර්ධනය සහ ශිල්පකලාවන්ගේ පැතිරීම යනාදිය මැනවින් වටහාගත හැකි ය.

**මුඛ්‍ය පදඃ** නම්පොත, පිරිවෙන් අධ්‍යාපනය, ලංකාවේ අධ්‍යාපන ක්‍රමය, විහාර අස්න

## ආශ්‍රිත ග්‍රන්ථ

අභයවර්ධන, එච්.ඒ.පී. (2014). *කඩඉම්පොත් විමර්ශනය*, කොළඹඃ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

පියදස්සි හිමි, හෙම්මාතගම හා ගුණසිංහ, හසිත චාමිකර (2023). *විවරණ සහිත විහාර අස්න හෙවත් නම්පොත පළමුවන කාණ්ඩය.* කොළඹඃ සමයවර්ධන පොත්හල (පුද්.) සමාගම.

වාචිස්සර හිමි, කොටගම, (2014). *සරණඞ්කර සඞ්ඝරාජ සමය*, බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශකයෝ.

විජයශ්‍රීවර්ධන, විභාවි (2000). *සිංහල භාෂාධ්‍යයන සම්ප්‍රදාය හා පාඨ්‍ය ග්‍රන්ථඃ මහනුවර යුගය*, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සන්නස්ගල, පුඤ්චි බණ්ඩාර (2013). *සිංහල සාහිත්‍ය වංශය.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

සාරානන්ද හිමි, පන්නිල සහ සරණංකර හිමි, ඕපාත (1956). *විවරණ සහිත නම්පොත හෙවත් විහාර අස්න.* තිස්ස ගුණසේකර, පිටිගල.